සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

28 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ....

ගෘහ ආර්ථික විද්‍යාව I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. ගෘහීය කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් ඉටුකිරීමට ඒකක සැළසුම් කිරීමේදී අවධානය යොමුකළ යුතු ගෘහ සැළසුම් මූලධර්මය වන්නේ,

1. අපේක්ෂාව 2. ඉඩකඩ 3. සංසරණය 4. රාශීකරණය 5. පිහිටීඅත.

02.



මෙයින් රිද්මය පෙන්නුම් කරන ආකාර පිළිවෙලින්,

1. විකිරණය, සංක්‍රමණය, ප්‍රතියෝගය තුළින් රිද්මය
2. සංක්‍රමණය, ප්‍රතියෝගය, අනුක්‍රමණය තුළින් රිද්මය
3. ප්‍රතියෝගය, සංක්‍රමණය, විකිරණය තුළින් රිද්මය
4. පුනරුත්තිය, අනුක්‍රමණය, විකිරණය තුළින් රිද්මය
5. ප්‍රතියෝගය, සංක්‍රමණය, අනුක්‍රමණය තුළින් රිද්මය

03. ගෘහ නිර්මාණ වලදී යොදා ගැනෙන සිරස් හා තිරස් රේඛා මගින් පිළිඹිබු වන්නේ,

1. ස්ථායී බව හා ඍජුබව 2. ඍජුබව හා නම්‍යශීලී බව 3. උසස් බව හා ශාන්ත බව
4. මිටිබව හා නම්‍යශීලී බව 5. ගෞරවනීය බව හා කැපීපෙනෙන බව

04. සමචතුරස්‍ර හැඩැති කාමරයක් ඍජුකෝණී හැඩයක් පිළිඹිබු කිරීමට යොදාගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

1. සිවිලිමට හා ගෙබිමට සුදු වර්ණය ආලේප කිරීම.
2. බිත්ති හතරටම ලා වර්ණ ආලේප කිරීම.
3. එක් බිත්තියකට පමණක් තද වර්ණය ආලේප කිරීම.
4. සමාන්තර බිත්ති දෙකකට තද වර්ණ ආලේප කිරීම.
5. එකිනෙකට ආසන්න බිත්තිවලට ලා වර්ණ ආලේප කිරීම.

05. ත්‍රිත්ව වර්ණ ගැලපුමට අනුව ආලින්දය වර්ණ ගැන්වීමේදී කහ කොළ වර්ණය සමග යෙදිය යුතු අනෙක් වර්ණ වන්නේ,

1. රතුදම් හා නිල් 2. දම් හා තැඹිලි 3. රතු තැඹිලි හා නිල්දම්
4. නිල් කොළ හා රතුදම් 5. නිල්කොළ හා රතුතැඹිලි

06. විද්‍යුතය මගින් ක්‍රියාකාරන බත් පිසින උඳුනක 750 W හා 230 V ලෙස සඳහන් විය. මෙම උපකරණයතුළින් ගලායනවිද්‍යුත් ධාරාව වන්නේ,

1. 2 A කි. 2. 5 A කි. 3. 3.2 A කි 4. 2.5 A කි 5. 10 A කි.

07. නිවසක 100 W ක විදුලි පහන් 5ක් පැය 2ක්ද. 50 W ක විදුලි පහන් 4ක් පැය 5ක් ද දිනකදි දැල්වේ. ඒ සඳහා වැයවන විදුලි ඒකක ප්‍රමාණය,

1. කිලෝ වොට් පැය 1.5 කි. 2. කිලෝ වොට් පැය 2.3 කි. 3. කිලෝ වොට් පැය 2.3 කි.
4. කිලෝ වොට් පැය 2 කි. 5. කිලෝ වොට් පැය 3.5 කි.

08. අපද්‍රව්‍ය කළමණාකරණය යටතේ පූතික ටැංකිය හා උරන වල සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ඝන අපද්‍රව්‍ය පූතික ටැංකිය හා උරන වල තුළ එකතු වේ.
2. උරන වළ තුළ නිර්වායු බැක්ටීරියා ක්‍රියා කරයි.
3. වැසිකිලි ගෙබිම පිරිසිදු කිරීමට ගන්නා සබන් පූතික ටැංකියට හිතකර වේ.
4. පූතික ටැංකිය තුළ නිර්වායු බැක්ටීරියා වියෝජනය නිසා මීතේන් ඇමෝනියා වැනි වායු නිපදවයි.
5. පූතික ටැංකියට ද්‍රව අපද්‍රව්‍ය එකතු වන අතර උරන වලට ඝන අපද්‍රව්‍ය එකතු වේ.

09. ගෘහීය සම්පත් වර්ගීකරණයට අනුව භෞතික හා භෞතික නොවන සම්පත් වන්නේ,

1. ශ්‍රමය හා ජලය 2. ඉඩකඩම් හා ජලය 3. ජලය හා විදුලිය
4. කාලය හා විදුලිය 5. ශ්‍රමය හා දැනුම

10. සබන් යනු,

1. සෝඩියම් සල්ෆේට් වේ. 2. කෝස්ටික් සෝඩා වේ. 3. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් වේ.
4. කෝස්ටික් පොටෑෂ් වේ. 5. සෝඩියම් ස්ටියරේට් වේ.

11. $$CH_3 - \underset{\displaystyle NH_2}{\overset{\displaystyle H}{\underset{|}{\overset{|}{C}}}} - COOH$$ මෙම ව්‍යුහ සූත්‍රයෙන් දැක්වෙන්නේ,

1. ග්ලූකෝස් 2. ඇලනින් 3. ග්ලයිසින් 4. ග්ලූටන් 5. ග්ලිසරෝල්

12. ඉන්සියුලින් හෝර්මෝනය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය මින් කුමක්ද?

1. නිෂ්පාදනය සඳහා ප්‍රෝටීන් අවශ්‍ය වේ. 2. සින්ක් ඉන්සියුලින් වල සංඝටකයකි.
3. ඉන්සියුලින් අග්න්‍යාසයේ නිෂ්පාදනය වේ. 4. ඉන්සියුලිස් ඌනතාව දියවැඩියාවට හේතු වේ.
5. ග්ලයිකොජන් ග්ලූකෝස් බවට පත් කරයි.

13. $C_{12}H_{22}O_{11}$ සූත්‍රයට අයත් ආහාර වර්ගය විය හැක්කේ,

1. මී පැණි. 2. අලිගැටපේර 3. කොමඩු 4. රටඉඳි 5. කිරි

14. කාබන් දාමයක ද්විත්ව බන්ධන 2ක් හෝ ඊට වැඩියෙන් අඩංගුව ඇත්තේ,

1. ඇස්කොබික් අම්ලය 2. ස්ටියරික් අම්ලය 3. පාමර්ටික් අම්ලය
4. ලිනෝලෙයික් අම්ලය 5. ඔලෙයික් අම්ලය

15. ඔමේගා 3 මේද අම්ල මගින් ශරීරය තුළ සිදුවන කාර්යයකි.
1. රුධිරයේ LDL ප්‍රමාණය වැඩි කිරීම. 2. දියවැඩියාව වැළැක්වීම.
3. රුධිරයේ ඝණත්වය වෙනස් කිරීම. 4. හෘදයාබාධ වැළැක්වීම.
5. රුධිරයේ HDL ප්‍රමාණය අඩු කිරීම.

16. ඇස්කොබික් අම්ලය, ටොකොෆෙරෝල් හා රෙටිනෝල් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. සත්වමය ආහාර වල බහුලව ඇත. 2. සිරුර තුළ නිපදවා ගනියි.
3. පරිවෘත්තීය සඳහා මේදය අවශ්‍ය වේ. 4. ජලයේ දියවේ.
5. ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි.

17. මුං ඇට / මාලු / කිරි යන ආහාර සම්බන්ධ නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල සියල්ලම අඩංගු වේ. 2. හිස් කැලරි සපයන ආහාර වේ.
3. විටමින් A හා C බහුලව අඩංගු වේ. 4. ලයිසින් නම් අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ලය අඩංගුය.
5. යකඩ හා අයඩින් බහුලව අඩංගු වේ.

18. විවිධ උෂ්ණත්ව පරාස තුළ ක්ෂුද්‍රජීවීන් ක්‍රියාකාරී වේ. ඒ අනුව තාපකාමී ක්ෂුද්‍රජීවී කාණ්ඩය හඳුන්වන්නේ,
1. ස්පිරුලම ලෙසය. 2. වෛරස් ලෙසය. 3. මෙසොෆීලික ලෙසය
4. තර්මෝෆීලික ලෙසය 5. සයික්‍රොෆීලික ලෙසය.

19. X නැමැති පරීරක්ෂිත ආහාරය සැකසීමේදී පහත දැක්වෙන සංසිද්ධි ඉවහල් වේ.
Ph අගය අඩුවීම බාහිරාසෘතිය සිදුවීම තාපයට ලක් කිරීම.
පරීරක්ෂණයේ දී ඉහත සඳහන් සියල්ලම ඉවහල් වූ ආහාරය වන්නේ,
1. කරවල 2. දිවුල්ජෑම් 3. මාලු ඇඹුල්තියල්
4. අලදෝසි 5. සීනි සම්බල

20. මස්වල ආවේණික රෝස පැහැය ආරක්ෂා කරමින් කල්තබා ගැනීම සඳහා භාවිත කරන ආකලනයකි,
1. සෝඩියම් ක්ලෝරයිඩ් 2. සෝඩියම් ප්‍රොපියුනේට් 3. සෝඩියම් නයිට්‍රේට්
4. පොටෑසියම් බෙන්සොයිඩ් 5. පොටෑසියම් මෙටාබයි සල්ෆයිඩ්

21. සිරුර තුළ කීටෝන් දේහ නිපදවීමට හේතුවන කරුණකි,
1. ආහාරයේ කාබෝහයිඩ්‍රේට් වැඩිවීම. 2. ආහාරයේ කාබෝහයිඩ්‍රේට් අඩුවීම.
3. ආහාරයේ ප්‍රෝටීන් වැඩිවීම 4. ආහාරයේ ප්‍රෝටීන් අඩුවීම
5. ආහාරයේ මේදය අඩුවීම.

22. අග්න්‍යාසයික ප්‍රදාහය / අග්න්‍යාසයික පිළිකා නිසා ඇතිවන දියවැඩියා තත්වය,
1. දියවැඩියා සංකූලතා 2. කීටෝසියාව 3. ප්‍රාථමික දියවැඩියා
4. ද්විතියික දියවැඩියාව 5. දියවැඩියා අධි මූර්ජාව

23. පෝෂ්‍ය පදාර්ථ පරිවෘත්තීය සඳහා අවශ්‍ය සහ එන්සයිම නිපදවීමට උපකාරවන විටමින් වර්ගයකි.
1. රෙටිනෝල් 2. තයමින් 3. කැල්සිපෙරෝල්
4. ඇස්කොබික් අම්ලය 5. ටොකොෆොරෝල්

24. කැල්සියම් අවශෝෂණයට හිතකර හා බාධාකරන හෝර්මෝන ඇතුළත් නිවැරදි කාණ්ඩය වන්නේ,
1. ඉන්සියුලින් හා ගැස්ට්‍රින් 2. කෝටිසෝල් හා ගැස්ට්‍රින් 3. ගැස්ට්‍රින් හා ග්ලූකගන්
4. තයිරොක්සීන් හා ග්ලූකගන් 5. ඉන්සියුලින් හා තෛරොක්සින්

25. හිමොග්ලොබින් යනු,

1. රුධිරයේ අඩංගු කාබෝහයිඩ්‍රේට් සංයෝගයකි. 2. රුධිරයේ අඩංගු ප්‍රෝටීන් හා විටමින් A සංයෝගයකි.
3. රුධිරයේ අඩංගු යකඩ හා ප්‍රෝටීන් සංයෝගයකි. 4. රුධිරයේ අඩංගු ප්‍රෝටීන් හා මේද සංයෝගයකි.
5. රුධිරයේ අඩංගු විටමින් හා ඛනිජ ද්‍රව්‍ය සංයෝගයකි.

26. දෘඩ ඇසුරුම් ද්‍රව්‍යයක් ඇතුළත් කාණ්ඩයක් නොවන්නේ,

1. තුනී ප්ලාස්ටික්, ඇලුමිනියම් පත්‍ර, ලෝහ 2. ලෝහ, වීදුරු, කාඩ්බෝඩ්
3. ප්ලාස්ටික්, ඇලුමිනියම් පත්‍ර, කාඩ්බෝඩ් 4. වීදුරු, ලෝහ, ඇලුමිනියම් පත්‍ර
5. තුනී ප්ලාස්ටික්, ලෝහ, කාඩ්බෝඩ්

27. මැලික් ඇම්ලය, සිට්‍රික් අම්ලය, ටාටරික් අම්ලය යන කාබනික අම්ල බහුලව අඩංගු ආහාර පිළිවෙළින් ඇතුළත් වන්නේ,

1. සියඹලා, බීට්රූට්, ගොරකා 2. ගොරකා, සියඹලා, දෙහි
3. ගොරකා, බීට්රූට්, සියඹලා 4. සියඹලා, ගොරකා, දෙහි
5. ගොරකා, දෙහි, සියඹලා

28. තයිරොක්සීන් හෝර්මෝනය මගින් සිරුරේ,

1. මූලස්ථ පරිවෘත්තීය වේගය (BMR) පාලනය කරයි. 2. ප්‍රතිශක්තිකරණ හැකියාව වැඩිකරයි.
3. ශරීරයේ උස අඩුකරයි. 4. පුරුෂ ප්‍රජනක හෝර්මෝන නිපදවීමට උදව්වේ.
5. ප්‍රතිදේහ නිපදවීමේ හැකියාව වැඩිකරයි.

29. ශරීරයේ විටමින් D ඌණතාවය නිසා සෑදෙන රෝගී තත්වයකි.

1. ශීතාද රෝගය 2. ගලගණ්ඩය 3. රිකට්ස්
4 පෙලග්‍රා 5. හිමෝෆිලියා

30. ප්‍රෝටීන් පරිවෘත්තීය ක්‍රියාවලියෙහි සංවෘත්තීය ක්‍රියාවක් නොවන්නේ,

1. හෝර්මෝන නිෂ්පාදනය 2. සිරුරේ පටක ගොඩනැගීම. 3. රුධිරය නිෂ්පාදනය
4. ශක්තිය මුදා හැරීම 5. එන්සයිම නිෂ්පාදනය

31.

X	Y
* සත්ව ආහාරවල නැත	* ශාක ආහාරවල ඇත.
* පැණි රසයි.	* පැණි රස නැත
* රුධිරයේ අඩංගු වේ.	* ශරීරය තුළ අඩංගු නොවේ.
* අන්ත්‍ර මගින් අවශෝෂණය වේ.	* අවශෝෂණය නොවේ.

මෙහි X හා Y යන කාබෝහයිඩ්‍රේට වනුයේ,

1. මෝල්ටෝස්, ලැක්ටෝස් 2.සීනි, පැණි. 3. ග්ලූකෝස්, ලැක්ටෝස්
4. ග්ලූකෝස්, සෙලියුලෝස් 5. සෙලියුලෝස්, මෝල්ටෝස්

32. ඇමයිනෝ අම්ල ක්ෂුද්‍රාන්තයේදී අවශෝෂණය වීම සිදුවනුයේ,

1. බාහිර ආස්‍රැතිය මගිනි. 2. සක්‍රීය පරිවහනය මගිනි. 3. අභ්‍යන්තර ආස්‍රැතිය
4. අක්‍රීය පරිවහනය මගිනි. 5. විසරණය මගිනි.

33. යීස්ට්, විටමින් C, සීනි යන ද්‍රව්‍යයන් අයත් ආකලන වන්නේ, පිළිවෙළින්

1. වර්ණකාරක, රසකාරක, පරිරක්ෂකකාරක 2. පිපුම්කාරක, ප්‍රතිඔක්සිකාරක, රසකාරක
3. පිපුම්කාරක, රසකාරක, ප්‍රතිඔක්සිකාරක 4. පරිරක්ෂකකාරක, රසකාරක, ප්‍රතිඔක්සිකාරක
5. රසකාරක, පිපුම්කාරක, පරිරක්ෂකාරක

34. පිසීමේ ක්‍රියාවලියෙන් ඉටුවන වාසියක් නොවන්නේ,
1. පෝෂණඅගය අඩුවීම. 2. ප්‍රමාණය වැඩිවීම 3. රුචිය වැඩිවීම
4. ආහාර සැහැල්ලුවීම. 5. අපේක්ෂිත වයනය ලැබීම.

35. අ.පො.ස. උසස් පෙළ විභාගය පෙනී සිටීමට යමින් සිටි සිසුවකු ගමන්ගත් බස්රථය කැඩීම නිසා ඇති වූ නොරිස්සුම් ස්වභාවය හඳුන්වන්නේ,
1. කාංසාව 2. විෂාදිය 3. ආතතිය 4. තරහ 5. ඉච්චාභංගත්වය

36. ළමාවියේ දරුවන් හා සම්බන්ධ 'අපයෝජනය' පිළිබිඹු වනඅවස්ථාවකි,
1. මුරණ්ඩු ගති පැවතුම් පෙන්වීම. 2. සොරකම්වලට යොමුවීම 3. දුම්පානයට පෙළඹීම.
4. මෙහෙකාර සේවයේ යෙදීම. 5. පවුලේ ඥාතීන් සමඟ සෙල්ලම් කිරීම.

37. යොවුන්වියට සුවිශේෂී වූ චර්යාමය ලක්ෂණයක් වන්නේ,
1. ආචාරශීලී බව 2. ප්‍රතිශේධනය 3. හුදකලාබව
4. කෝපාවේගය 5. කැපී පෙනීමේ ආශාව

38. මව්කිරි නිපදවීම උත්තේජනය කිරීමට හේතුවන හෝර්මෝනය වන්නේ,
1. ප්‍රොජෙස්ටරෝන්, ඔක්සිටොසින් 2. ප්‍රොලැක්ටින්, ඊස්ට්‍රජන්
3. ඔක්සිටොසින්, ප්‍රොලැක්ටින් 4. ඊස්ට්‍රජන්, ප්‍රොජෙස්ටරෝන්
5. ප්‍රොලැක්ටින්, ප්‍රොජෙස්ටරෝන්

39. ස්ත්‍රී ප්‍රජනක හෝර්මෝනය ස්‍රාවය උත්තේජනය කරන අන්තරාසර්ග ග්‍රන්ථිය වන්නේ,
1. අධිවෘක්ක ග්‍රන්ථිය 2. පිටියුටරි ග්‍රන්ථිය 3. තයිරොයිඩ් ග්‍රන්ථිය
4. ස්නේහස්‍රාවී ග්‍රන්ථිය 5. පැරාතයිරොයිඩ් ග්‍රන්ථිය

40. නවජ දරුවකුගේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A අධික ශබ්දවලට හිස ඔසවයි. B දවසේ වැඩි වේලාවක් නිදයි.
C සංවේදන වලට තිගැස්සෙයි D චලනය වන වස්තූන් දෙස බලයි.
E හැඬීම මගින් ප්‍රතිචාර දක්වයි.
මෙයින් ප්‍රතීක ක්‍රියා මොනවාද?
1. B,D 2. A, B, C 3. C, D, E 4. A, B 5. C, E

41. පූර්ව ප්‍රසව සායනයකදී මවට දෙනු ලබන පෝෂක 3කි.
1. අයඩීන්, ෆෝලික් අම්ලය, යකඩ 2. කැල්සියම්, විටමින් C, යකඩ
3. ෆෝලික්, සින්ක්, විටමින් A 4. පොස්ෆරස්, විටමින් A, විටමින් D
5. සින්ක්, කැල්සියම්, අයඩීන්

42. මාස හය ඉක්මවූ ළදරුවෙකුට දෙනු ලබන එන්නතක් වනුයේ,
1. MMR එන්නත 2. DT එන්නත
3. පංච සංයුජ එන්නත තෙවන මාත්‍රාව 4. පංච සංයුජ එන්නත දෙවන මාත්‍රාව
5. ත්‍රිත්ව එන්නත

43. රෙද්දකින් ඇඳුමක් කැපීමට පෙර එහි විකර්ණාකාර දෙකළවරින් ඇද උණුසුම් ස්ත්‍රික්කයකින් මදිනු ලැබේ. එහි අරමුණ වනුයේ,
1. රෙද්දේ ඇද ඉවත්කර ගැනීමයි. 2. රෙද්දේ කැඳ ඉවත්කර ගැනීමයි.
3. මැසීමට පහසුව සඳහා 4. රෙද්දේ දික් අත සෙවීමසඳහා
5. සිනිඳු මතුපිටක් ලබාගැනීම සඳහා

44. විකර්ණාකාර පටිය සාරි හැට්ටයේ කරට තබා මසා පටියෙන් අඩක් නවා නොපිටට හරවා පළමු මැස්ම මත වාටිය මැසීම හඳුන්වන්නේ,

1. පෝරු වාටිය යනුවෙනි. 2. හැඩ පෝරුව යෙදීම. 3. පයිපින් කිරීම.
4. බඳනවාටි යෙදීම. 5. රැළිපටි ඇල්ලීම

45. රෙදිපිළි නිමාවන් ලබාදීමේදී රෙද්දක රැළි ඉවත් කිරීම සඳහා රෙදි තෙරපීමට භාජනය කිරීමේ යාන්ත්‍රික ක්‍රමය හඳුන්වන්නේ,

1. ටෙන්ටරීකරණය 2. සැන්ෆරයිස් කිරීම. 3. කැලැන්ඩරීකරණය කිරීම.
4. මසර කිරීම. 5. ක්‍රේප් කිරීම.

46. 

මෙම රූපයෙන් දක්වා ඇත්තේ,

1.පිහාටු මැස්ම 2. ලේසිඩේසිමැස්ම
3. කතිර මැස්ම 4. රුමේනියම් මැස්ම
5. කේබල් මැස්ම

47. විකර්ණාකාර පටි ඇල්ලීම රේන්ද ඇල්ලීම
වාටිය නවා මැසීම ටසල් ඇල්ලීම
යන මැහුම් ක්‍රම

1. අද්දර නිම කිරීමේ ක්‍රම 2. වාටි මැසීමේක්‍රම 3. මූලික මැහුම් ක්‍රම
4. සාරි හැට්ටයේ කර නිම කිරීමේ ක්‍රම 5. ළදරු අලංකරණ කිරීමේ ක්‍රම.

48. පිළිස්සීමේ පරීක්ෂණයක නිගමන පහත දැක්වේ.

A පිහාටු පිළිස්සෙන ගඳක් දැනේ.
B කළු පැහැති පබළු වැනි ද්‍රව්‍යයක් ඉතිරි වේ.
C දැල්ලට ඇල්ලූ විට අක්‍රමවත්ව දැල්වේ. ඉවත්කළ විට නිවේ.
D පිළිස්සීමේදී කඩදාසි පිළිස්සෙන කඳ දැනේ
E අළු පැහැයට අළු ඉතිරි වී කැඩී යයි.

මින් ලෝම කෙන්දක ලක්ෂණ වන්නේ,

1. A, B, C 2. A, C, E 3. A, B, D
4. A, E, C 5. A, C, D

49. සේද කෙන්දක හා ලෝම කෙන්දක අඩංගු ද්‍රව්‍ය පිළිවෙළින් සඳහන් වන්නේ,

1. සෙලියුලෝස් හා පෙරසීන් 2. කෙරටීන් හා සෙලියුලෝස්
3. සෙරසීන් හා කෙරටීන් 4. සෙලියුලෝස් හා කෙරටින්
5. කෙරටින් හා සෙරසින්

50. කපු ඇඳුමක ඇතිවූ ලැකර් පැල්ලමක් ඉවත්කර ගැනීම සඳහා භාවිතා කළ හැකි රසායනික කාරකය වන්නේ,

1. ටර්පන්ටයින් 2. සෝඩියම් බයි කාබනේට් 3. බෙන්සින්
4. බෝරැක්ස් 5. මෙතිලේටඩ් ස්ප්‍රිතු

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

28 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ....

ගෘහ ආර්ථික විද්‍යාව II

කාලය පැය තුනයි

උපදෙස්:-

1 කොටසින් පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකටද 11 කොටසින් පස්වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකටද පිළිතුරු සපයන්න.

I කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. නිවෙස් හිමියාගේ අපේක්ෂා ඉටුවන ආකාරයට නිවෙස් සැලසුම් කිරීම හා අලංකාර කිරීම, ගෘහ නිර්මාණ ශිල්පියාගේ අභිප්‍රාය විය. කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම උපයෝගී කරගැනීමෙන් සැලසෙන අභ්‍යන්තර අලංකරණය එම නිවස තුළ ප්‍රසන්න සුවදායී ජීවන පරිසරයක් ඇති කිරීමට උපකාරී වේ.

I. ගෘහයක් නිර්මාණය කිරීමේදී යොදා ගන්නා ගෘහ සැලසුම් මූලධර්ම 5 සඳහන් කරන්න.

II. ගෘහය තුළට පිරිසිදු වාතාශ්‍රය ලබාගත හැකි ක්‍රම නම්කර, පිරිසිදු වාතාශ්‍රය ලැබීමෙන් ඇති ප්‍රයෝජන ලියන්න.

III. (අ) ක්‍රියානුරූපී බව යන්න පැහැදිලි කරන්න.
(ආ) වර්ණ අගමානය උදාහරණ සහිතව විස්තර කරන්න.

IV. (අ) ගෘහයේ ප්‍රසන්න බව වැඩිකිරීම උදෙසා ගෘහ පිළි යොදාගනී. ගෘහ පිළි කට්ටලය නිර්මාණය සඳහා පිරිසැලසුම ගොඩ නගන්න.
(ආ) ගෘහ පිළි සඳහා භාවිතා කළ හැකි මැහුම්වර්ග කර දක්වන්න.

V. ඔබ නිවසේ මුළුතැන්ගෙය මේසය අලංකාර කිරීම සඳහා ක්‍රියානුරූපී බවින් යුත් උපාංග නම්කරඉන් එකක් නිර්මාණය කරන අයුරු විස්තර කරන්න.

02. I. තිර රෙදි දැමීමේදී වාණිජමය ආධාරක භාවිතා කිරීමෙන් වැඩි අලංකාරයක් ලැබේ.
(අ) මෙම ආධාරක නම් කරන්න.
(ආ) ආධාරක භාවිතයෙන් තිර රෙදි යොදාගන්නා අයුරු විස්තර කරන්න.

II. (අ) රෙදිපිළිවල ගුණාත්මක තත්වය වැඩිදියුණු කිරීමට යොදාගන්නා තාක්ෂණික ක්‍රම මොනවාද?
(ආ) ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න.

III. (අ) රෙදිපිළි මුද්‍රණයේදී ස්ථිරව සායම් ගැන්වීම සඳහා යොදන පෙර පිරියම් ක්‍රම හා පසු පිරියම් ක්‍රම 4 නම් කරන්න.
(ආ) රෙදි අලංකරණ ක්‍රමයක් වන ආරෝපණ ක්‍රමය විස්තර කරන්න.

IV. සාරි හැට්ටයේ අත නිර්මාණය කරන අයුරු රූපසටහන් මගින් විස්තර කරන්න.

03. I. ජලයේ තාවකාලික කඨිනත්වය හා ස්ථිර කඨිනත්වය පැහැදිලි කර, එම කඨිනත්වය ඉවත් කරගන්නේ කෙසේද?

II. (අ) ගෘහ අභ්‍යන්තර සෞන්දර්යාත්මක බව වැඩිදියුණු කිරීමට යොදාගත හැකි නිර්මාණ මොනවාද?

(ආ) එම ගෘහස්ථ නිර්මාණ නඩත්තු කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවාද?

III. කෙඳි වර්ගවල ගුණාංග හඳුනාගැනීමට පරීක්ෂා කිරීමට සිදුවිණි.

(අ) නයිලෝන් හා කපු කෙඳිවල පිළිස්සීමේ හා අන්වීක්ෂීය බැලීමේදී දක්නට ලැබෙන ලක්ෂණ මොනවාද?

(ආ) පුනර්ජනනීය කෙඳි හා කෘත්‍රිම කෙඳි අතර වෙනස පැහැදිලිකරන්න.

IV. 12 ශ්‍රේණියේ ඔබ ඉගෙනගත් ටීපෝකවරය මසා නිම කිරීමේදී එහි වාටි අද්දර නිම කිරීමට යොදා ගත් මූලික හා ශිල්පීය මැහුම් ක්‍රම නම් කරන්න.

04. I. ඔබගේ නිදන කාමරය අලංකාර කිරීම සඳහා ගෘහභාණ්ඩ තැන්පත් කිරීමේදී සැලකිය යුතු කරුණු 4 ලියන්න.

II. (අ) නිවසේ භාවිතා කරන ආලෝක උත්පාදක උපකරණ හා තාප උත්පාදක උපකරණ මොනවාදැයි නම් කරන්න.

(ආ) විදුලි ස්ත්‍රික්කයේ තාප පාලනය සිදුවන අයුරු පැහැදිලි කරන්න.

III. (අ) පහත දත්ත ඇසුරින් යොවුන් දියණියකට සුදුසු නිදන කාමරයක් සඳහා බිම්සැලසුම් ඇඳ, එහි භාණ්ඩ තැන්පත් කරන අයුරු රූපසටහන් මගින් දක්වන්න.

- කාමරයේ දිග පළල = 12' x 10'
- දොරෙහි ප්‍රමාණ = 6' x 3'
- පියන් 2 ජනේලය = 3.6' x 6.0'

(ආ) මෙම කාමරයට සුදුසු ඒක වර්ණ ගැලපුම යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

II කොටස

පස්වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න තුනක් ද ඇතුලුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

05. පාසලක දරුවන් පිළිබඳ සමීක්ෂණ වාර්තාවක පහත තොරතුරු ඇතුළත් විය.

* 4 - 5 ශ්‍රේණිවල දරුවන් සමවයස් කණ්ඩායම් වලට ලැදියාවක් දැක්විය.
* 12 - 13 ශ්‍රේණිවල දරුවන් වගකීම් දැරීමට හා නායකත්වයට කැමැත්තක් දැක්වීම.
* බොහෝ දරුවන් විවිධ පිටිමෝලි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනයට හුරුවී තිබීම.
* දරුවන්ගෙන් බොහෝ පිරිසකට බෝවෙන රෝග වැනි රෝගී තත්වයන් දැකියහැක.

I. පසු ළමාවිය දරුවන්ගේ යහපත් සමාජමය හැසිරීම් රටා වෙන් වෙන්ව දක්වන්න.

II. යොවුන් වියේ දරුවකුගේ පෞරුෂ වර්ධනයසඳහා දෙමව්පියන්, ගුරුවරුන්ගේ කාර්යභාරය ලියන්න.

III. ඔබ අධ්‍යයනය කළ සන පිටි මෝලි වර්ග 3ක් නම්කර එහි ගුණාත්මක බව ලබාගැනීමට අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම සැකෙවින් දක්වන්න.

IV. වර්තමාන සමාජය තුළ බහුලව පවතින බෝ නොවන රෝග 4ක් නම්කර පුද්ගලයාගේ ආහාර පරිභෝජන රටාව මෙම රෝග කෙරෙහි බලපාන අයුරු පැහැදිලි කරන්න.

IV. (අ) පසු ළමාවිය දරුවකු සඳහා රැගෙන යාමටසුදුසු දිවා ආහාර වේලක් ලියන්න.

(ආ) ඔබ සඳහන් කළ ආහාරවේලෙහි පෝෂණමය වටිනාකම ලියන්න.

06. පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න.

I. මුල් ළමාවිය දරුවන්ගේ සමාජ වර්ධනයට, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකින් ඉටුවන කාර්යභාරය.

II. පසු ළමාවිය දරුවන්ගේ කායික වර්ධනයන්හි ස්වභාවය.

III. යොවුන් දරුවන්ට 'නායකත්වය කඳවුරු' වැඩසටහන් වල වැදගත්කම.

IV. දරුවන්ට ශාක ආහාර වලට වඩා සත්ව ආහාර ලබාදීමේ වැදගත්කම.

07. ආහාරවල අඩංගු පෝෂක ශරීරයට උපයෝගී වන ආකාරයට සකසා ගැනීම හා පරිභෝජන කිරීම ඉතා වැදගත් වේ.

I. ආහාරවල අඩංගු පෝෂකවල ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව වැඩිකිරීමේ ක්‍රම ශිල්ප මොනවාද? උදාහරණ සපයන්න.

II. මේද වර්ගීකරණය දක්වන්න.

III. පහදන්න.

(අ) ශීතනයෙන් සකසන ආහාර වර්ගවලට ජෙලටින් යෙදීම.

(ආ) අයඩින් මිශ්‍ර ලුණු දුඹුරු පැහැ බෝතල්වල ඇසිරීම.

IV. මිනිස් සිරුරේ උෂ්ණත්වය පාලනය කිරීමට මේදය උපකාරී වේ. විමසන්න.

08. ජීර්ණය හා අවශෝෂණ ක්‍රියාවලියේදී ජීර්ණ ග්‍රන්ථිවල සැකසීම ඒවා මගින් නිපදවන ස්‍රාවයන් හා අනෙකුත් සංඝටක හා ඒවායේ ක්‍රියාකාරිත්වය වැදගත් වේ.

I. ආහාර ජීර්ණය වීම කෙරෙහි බලපාන සාධක කෙටියෙන් හඳුන්වන්න.

II. පෝෂක අවශෝෂණය සඳහා කුඩාන්ත්‍රයේ කාර්යභාරය විස්තර කරන්න.

III. ශිෂ්‍යාවක් උදෑසන ආහාර වේලට බත් පරිප්පු සහ පොල් සම්බල ලබා ගත්තාය. ඒවායේ ක්‍රියාකාරිත්වය පහත වගුව ඇසුරෙන් ඉදිරිපත් කරන්න.

ආහාර	පෝෂකය	ඉන්ද්‍රිය	ජීර්ණ යුෂය	එන්සයිම	ප්‍රතික්‍රියාව
පරිප්පු	ප්‍රෝටීන්		ආමාශයික යුෂ		
		ග්‍රහණිය			
				පෙප්ටිඩේස්	
බත්	කාබෝහයිඩ්‍රේට්	මුඛය			
			අග්න්‍යාසයික යුෂ		
				සුක්‍රේස්	
					ග්ලූකෝස් හා ග්ලූකෝස්
පොල් සම්බෝල	මේදය	ග්‍රහනිය	පිත්‍යුෂ		
			අග්න්‍යාසයික යුෂ		

IV. ඇමයින්හරණය යනු කුමක්ද?

09. I. පහත සඳහන් ක්ෂුද්‍රජීවීන් ආහාර සැකසීමේදී ප්‍රයෝජනවත් වන ආකාරය විස්තර කරන්න.

1. ස්ට්‍රෙප්ටොකොකොස් ලැක්ටික් 2. ලැක්ටො බැසිලස් බල්ගරිකස් 3. යීස්ට්

II. * තෛලෝදකරණය යන්න පැහැදිලි කරන්න.

III. මුල් ළමාවියේ දරුවන් අතර භාෂා සංවර්ධනයේ දුර්වලතා මගහරවා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද?

IV. ''සමාජය නව ප්‍රවණතාදරුවාගේ සදාචාරාත්මක වර්ධනය කෙරෙහි බලපායි'' විමසන්න.

තෙවන වාර පරීක්ෂණය - 2018
ගෘහ ආර්ථික විද්‍යාව 13 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය.
I කොටස.

01. - 4	**11.** - 2	**21.** - 2	**31.** - 4	**41.** - 2
02. - 5	**12.** - 5	**22.** - 4	**32.** - 2	**42.** - 3
03. - 3	**13.** - 5	**23.** - 2	**33.** - 2	**43.** - 1
04. - 4	**14.** - 4	**24.** - 3	**34.** - 1	**44.** - 4
05. - 3	**15.** - 4	**25.** - 3	**35.** - 3	**45.** - 3
06. - 3	**16.** - 5	**26.** - 3	**36.** - 4	**46.** - 4
07. - 4	**17.** - 4	**27.** - 5	**37.** - 5	**47.** - 1
08. - 4	**18.** - 4	**28.** - 1	**38.** - 3	**48.** - 1
09. - 3	**19.** - 3	**29.** - 3	**39.** - 2	**49.** - 3
10 - 5	**20.** - 3	**30.** - 4	**40.** - 5	**50.** - 1

II කොටස

01. i. සංසරණය, වාතාශ්‍රය හා ආලෝකය, අපේක්ෂාව, ඉඩකඩ, සනීපාරක්ෂාව, රාශිකරණය, ප්‍රායෝගික බව, නම්‍යතාව, ආරක්ෂාව. (ලකුණු 5)

ii. දොර, ජනෙල්, වාකවුළු ලැටිස්, දැල්, මැද මිදුල්. (ලකුණු 2)

ප්‍රයෝජන : 1 ආශ්වාස කිරීමට අවශ්‍ය ඔක්සිජන් සැපයීම. 2. උෂ්ණය, තාපය පාලනය
3. නිවස තුළ අපද්‍රව්‍ය ඉවත්කිරීම. 4. ආර්ද්‍රතාවය පාලනය කිරීම. (ලකුණු 3)

iii. I. කිසියම් නිර්මාණයකින් ඉටුවිය යුතු මෙහෙය හෙවත් කාර්යය සඳහා එය නිසි පරිදි සැකසී තිබීමයි. (ලකුණු 1)

II. වර්ණ අගය හෝ වටිනාකම් ලා බවේ සිට තද බව හෝ තද බවේ සිට ලා බව දක්වන දර්ශකයකි/මානයකි. (ලකුණු 3)

iv. I. * අවශ්‍ය රෙදි වර්ගය හා එහි ස්වභාවය තීරණය කිරීම. * දිග, පළල, හැඩය තෝරා ගැනීම. (මිනුම්)
* මැසීම සඳහා යොදාගන්නා මෝස්තරය. * මෝසරතය යොදන ස්ථානය. * ඒ සඳහා යොදාගන්නා මැහුම් ක්‍රම.
* යොදාගන්නා වර්ණවත් නූල් හා නූල්වල වර්ගය. (ලකුණු 3)

II. මූලික මැහුම්, විසිතුරු මැහුම්, ශිල්පීය මැහුම්. (ලකුණු 3)

v. * මේස දරුණු, පුද්ගලික කවර, හැඳි පිහි අල්ලුව, අත්පිස්නා. (ලකුණු 2)
* විස්තර කිරීමට (ලකුණු 3)

02. i. (අ) රේලින්ස්, ලී පොලු, කොකු, මුදු, දඟර කම්බි. (ලකුණු 2)

(ආ) විවිධ අමුද්‍රව්‍යවලින් නිමවා ඇත. (ලී, යකඩ, ප්ලාස්ටික්, තඹ) තිර රෙදි ප්‍රමාණය අනුව පොදු භාවිතා වේ. තනි රෙද්ද තනි පොලුද තිර රෙදි 2 සඳහා පොලු 2 භාවිතා කරන්න. (ලකුණු 4)

ii. (අ) කැලැන්ඩරීකරණය, සැන්පරයිස් කිරීම, ඩයිකිරීම,
ටෙන්ටරීකරණය, මසර කිරීම, ජලරෝධක නිමාව. (ලකුණු 2)

(ආ) සිසු පිළිතුර අනුව (ලකුණු 2)

iii. (අ) පෙර පිරියම් ක්‍රම : 1. කැඳ ඉවත්කිරීම, 2. විරංජනය කිරීම පසු පිරියම් ක්‍රම : 1. තාපයට භාජනය කිරීම, 2. සේදීම
(එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 4යි)

(ආ) ආරෝපණය කිරීම : * වර්ණවත් ගැළපෙන රෙදි භාවිතය, * අවශ්‍ය අවස්ථාවලදී රෙද්දේ මෝස්තරය ඇඳීම. * අළුතින් යොදන කැබලි රෙදි මසන රෙද්දට තබා තාවකාලික මැස්මක් යෙදීම. * සුදුසු මැස්මක් යොදා නිම කර අනවශ්‍ය කොටස් කපා ඉවත් කිරීම. (ලකුණු 2)

iv. * ලම්භක රේඛා 2 හමුවන ලක්ෂණය. A
* A සිට ඉහළය කප් උස Z.
* A සිට පහළට අත යට මිනුම
* A සිට දෙපසට අතේ මහත සමානව දෙපසට XY.



* P සිට දෙපසට අග පළල සමානව දෙපස Q,R * Z,X හා ZY යාකර අත්යට හැඩය අඳින්න. මැහුම් වාසි තබන්න.
(ලකුණු 4)

03. i. * තාවකාලික කඨිනත්වය - කැල්සියම් බයිකාබනේට් $Ca(HCO_3)_2$,

මැග්නීසියම් බයිකාබනේට් $MgHCO_3$ දියවී තිබීම

* ස්ථිර කඨිනත්වය - කැල්සියම් සල්ෆේට් $CaSO_4$

මැග්නීසියම් ක්ලෝරයිඩ් $MgCl_2$ දියවී තිබීම (ලකුණු 4)

තාවකාලික කඨිනත්වය ඉවත් කිරීම - ජලය උණු කිරීම.

$$Ca(HCO_3)_2 \rightarrow CaCO_2 + H_2O + CO_2\uparrow$$

CO_2 පිටවේ. අද්‍රාව්‍ය කැල්සියම් කාබනේට් බඳුනේ තැන්පත්වී ඉතිරි ජලය මෘදු වේ.

$$CaSO_4 + Na_2CO_3 - CaCO_3\downarrow + Na_2SO_4$$

ii. (අ) තිරරෙදි, ගෘහ භාණ්ඩ, විවිධ උපාංග, දියඇලි, මැද මිදුල්, ගෘහස්ත පොකුණු, මල් සැකසුම් (ලකුණු 2)

(ආ) දිනකට වරක්ම ඒවා පිළිබඳ අවධානය යොමු කිරීම, නිර්මාණය අවශ්‍ය ජලය හෝ වෙනත් අවශ්‍ය දේ යොදා අළුත්වැඩියා කිරීම ආදී සිසු පිළිතුර අනුව. (ලකුණු 4)

iii. (අ) පිළිස්සීම — අන්වීක්ෂීය පෙනුම

කපු - වහා ගිනි ගනී, කහපාට දැල්ල, කඩදාසි පිළිස්සෙන ගඳ, අළු කළුපාට. — පීත්ත පටියක් මෙන්

නයිලෝන් - ගින්නට ඇල්ලු විට හැකිලේ. උණුවේ. සුදුපාට කැටියක් මෙන්ය. ඉවත්කළවිට කළුපාට වේ. — විනිවිද පෙනෙන සිලින්ඩරාකාර වේ. (ලකුණු 4)



(ආ) පුනර්ජනනීය කෙඳි — කෘත්‍රිම කෙඳි

* ශාක හා සත්ව කෙඳි වර්ග 2ම එකට මිශ්‍රකර සාදාගන්නා කෙඳිවර්ග. — * රසායනික ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිපදවන කෙඳි

උදා : රෙයෝන්, විස්කෝස් — උදා: නයිලෝන්, පොලිඇමයිඩ් (ලකුණු 2)

iv. * රේන්ද ඇල්ලීම. * ටසල් ඇල්ලීම. * බීක්කු මැසීම. * විකර්ණකාර පටි ඇල්ලීම (බයින්ඩින්), * පෝරු වාටියක් යෙදීම. (ලකුණු 4)

04. i. * කාමරයට ගැළපෙන පරිදි සැලැස්මක් ඇඳ ඒ අනුව භාණ්ඩ තැන්පත් කිරීම.

* විශාල ගෘහභාණ්ඩ පළමුව තබා ඊට ගැළපෙන කුඩා භාණ්ඩ තැබිය යුතුයි.

* කාමරයේ ගමන් මග අවහිර නොවිය යුතුයි. * කාමරයේ ප්‍රමාණය අනුව භාණ්ඩ තෝරාගැනීම.

* කලා මූලිකාංග හා මෝස්තර මූලධර්ම වලට අනුකූලව භාණ්ඩ තැන්පත් කිරීම. (ලකුණු 4)

ii. (අ) අලෝක උත්පාදන - විදුලි පහන්, සූත්‍රිකා පහන්, ප්‍රතිදීප්ත පහන්.

තාපෝත්පාදන - විදුලි උඳුන, තප්ත උඳුන, ස්ත්‍රික්කය, බත් පිසින උඳුන. (ලකුණු 2)

(ආ) මූලාවයවය මගින් විද්‍යුත් ශක්තිය තාප ශක්තිය බවට පත්වේ. වෙනස් වූ ප්‍රසාරණ සංගුණක යුත් ලෝහ වර්ග 2 නිර්මාණය වී ඇත. ද්වි ලෝහ දණ්ඩ මගින් අවශ්‍ය ප්‍රමාණයට තාපය පාලනය වේ. ලෝහ 2 ප්‍රසාරණ සංගුණක වෙනස් ය. රත් වූ විට අඩු සංගුණකයක් ඇති ලෝහය දෙසට වක්‍ර වේ. එවිට විද්‍යුත් පරිපථය විසන්ධි වේ. එමගින් තාප පාලනය සිදුවේ. (ලකුණු 4)

iii. (අ) නියමිත ප්‍රමාණයන්ට අනුව දොර, ජනේලය දමා තිබීම, බිත්තිවල ප්‍රමාණය, භාණ්ඩ තැන්පත් කර ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 6)

(ආ) කාමරයේ බිත්ති, උපාංග, ගෘහභාණ්ඩ වල වර්ණ ගැලපීම් පිළිවෙළ විස්තර කිරීම. එක් වර්ණය ප්‍රභේද යොදාගෙන තිබීම සලකා බලන්න. (ලකුණු 4)

05. i.

යහපත්	**අයහපත්**
සහයෝගය	ප්‍රතිශේධනය
තරඟකාරීබව	උසුළුවිසුළු කිරීම.
ත්‍යාගශීලීබව	ආත්මකේන්ද්‍රීය බව
අනුකම්පාව	විරුද්ධ ලිංගික විරෝධය
මිත්‍රශීලී බව	
අනුකරණය	

(ලකුණු 5)

ii.

දෙමව්පියන්	**ගුරුවරුන්**
* ආදරය සෙනෙහස දැක්වීම	* මානසික අවශ්‍යතා ඉටුකිරීම
* රැකවරණය සැලසීම	* අපක්ෂපාතීවීම
* භෞතික අවශ්‍යතා ඉටු කරදීම.	* අගය කිරීම.
* දරුවා අගය කිරීම.	* කණ්ඩායම් ක්‍රියා ලබාදීම.
* අදහස් පිළිගැනීම.	* නායකත්ව වැඩසටහන් කිරීම.

(ලකුණු 4)

iii. **<u>ෂෝර්ට් ක්‍රස්ට්</u>** **<u>ෆ්‍ලූ පේස්ට්‍රිය</u>**

* අයිස්වතුර භාවිතය * මේදය දිය කිරීම (රත් කිරීම)

* ඇඟිලි තුඩුවලින් ඇනීම. * බිත්තර ගසා දැමීම. * සැහැල්ලු පිටි මෝලියක් සැකසීම.

<u>පෆ් පේස්ට්‍රිය</u>

* තද මාගරින් දැමීම. * අයිස්වතුර/දෙහි එකතු කිරීම. (නම් කිරීමට ලකුණු 1)

* පිටිමෝලිය තුනී කිරීම/නැවීම. (විස්තර කිරීමට ලකුණු 4)

iv. මල බද්ධය, දියවැඩියාව, ආමාශයික ප්‍රදාහය, හෘදරෝග. (ලකුණු 2)

මල බද්ධය - පිරිපහදුකළ ආහාර ගැනීම, කාර්ය බහුලවීම, නිරාහාරව සිටීම, ක්ෂණික හෝ සැකසූ ආහාර ගැනීම, විරේකවලට හුරුවීම.

දියවැඩියාව - තන්තු ආහාර නොගැනීම, පිටි අධික ආහාර ගැනීම, සීනි අධික ආහාර ගැනීම, කාබනිකාංග පාන භාවිතය.

ආමාශයික ප්‍රදාහය : නිරාහාරව සිටීම, අම්ල වැඩි ආහාර, මිරිස් වැඩිපුර ගැනීම, ප්‍රබල ඖෂධ ගැනීම.

හෘද රෝග - මේද අධිකවීම, සීනි අධිකවීම, ක්ෂණික ආහාර (චිප්ස්) සැකසූ ආහාර භාවිතය, තන්තු ආහාරඅඩුකම. (ලකුණු 4)

v. (අ) සුදුසු බොජුන්පත (ලකුණු 2)

(ආ) එහි පෝෂණමය වටිනාකම පැහැදිලි කිරීම. (ලකුණු 3)

06. i. * ආදරය සෙනෙහස දැක්වීම. * දරුවාගේ කායික, මානසික, සමාජමය සංවර්ධනයට උදව් වීම.

* භාෂා හැකියාව දියුණු කිරීම. * යහපත් සිරිත්විරිත්, සාරධර්ම පුහුණු කිරීම.

* සාමූහිකත්වය, මිත්‍රශීලීබව, ආරක්ෂාව ලබාදීම. * වැඩිහිටියන්ට ගරු කිරීම උදව් වීම ආදී. (ලකුණු 5)

ii.* මුල් ළමාවියට සාපේක්ෂව මන්දගාමී වර්ධනයක් ඇත. * කිරිදත් වෙනුවට ස්ථිර දත් ඒම.

* උස, බර වැඩිවීම. * මොළයේ වර්ධනය වීම. (ලකුණු 5)

iii. වගකීම් දැරීමට හුරුවීම, නිර්මාණාත්මක බව, ඉදිරිපත්වීම, තීරණගැනීමේ හැකියාව, තර්ක කිරීමේ හැකියාව, සන්නිවේදන කුසලතා දියුණුවීම, දරා ගැනීමේ හැකියාව, ආචාරශීලීබව. (ලකුණු 5)

iv. හිමි යකඩ අඩංගුවීම, අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල තිබීම, සම්පූර්ණ ප්‍රෝටීන් තිබීම, විටමින් D, කැල්සියම් බහුලවීම අත්‍යවශ්‍ය මේද අම්ල තිබීම. (ලකුණු 5)

07. i. බීජ ප්‍රරෝහනය - මුං ඇට පැල කිරීම - යකඩ, විටමින් B7 අගය ඉහළ යයි, විටමින් C බහුල වේ.

ආහාර පරිපූරණය - මුං කිරිබත්, තෝසේ, කීවරි විටමින් ඛනිජ ඉහළ යයි.

පැසීමට, පිපීට ලක්කිරීම - ආප්ප, තොසේ, ඉට්ලි (නම් කිරීමට 4)

සරු කිරීම ප්‍රබල කිරීඹ -

ii.I. මේද වර්ගීකරණය ඇඳ තිබීම. (ලකුණු 4)

iii. ජෙලටින් ශීත කිරීමේදී කැටි බවට පත්වේ.

තාපයට, හිරුඑළියට අයඩින් විනාශවීම වැළැක්වීම. (ලකුණු 6)

iv. ලබාගන්නා මේද අතිරික්තය සම යට ඇඩිපෝස් පටකයේ තැන්පත් කරයි. පරිසර උෂ්ණත්වය වෙනස්වීම හරීර උෂ්ණත්වය වෙනස් නොවී තබා ගැනීමට මෙම පෝෂ්‍ය පදාර්ථය උපකාරී වේ. (ලකුණු 6)

08. i. සානසික සාධක - සුවඳ, ගඳ, රසය භෞතික සාධක - ආහාර මාර්ගය ඔස්සේ සිදුවන සැපීම, තල්ලු කිරීම.

රසායනික සාධක - එන්සයිම, ගුණාංග (ලකුණු 4)

ii.* ජීර්ණය වූ ආහාර අවශෝෂණය සම්පූර්ණයෙන්ම සිදුවන්නේ කුඩා අන්ත්‍රයේදීය.

* ඇමයිනෝ අම්ල, ග්ලූකෝස් අන්ත්‍රවල ඇති අංගුලිකා මගින් අවශෝෂණය වේ. * මේදය අවශෝෂණය නොවේ.

iii. (ලකුණු 4)

ආහාර	පෝෂකය	ඉන්ද්‍රිය	ජීර්ණ යුෂය	එන්සයිම	ප්‍රතික්‍රියාව
පරිප්පු	ප්‍රොටීන්		ආමාශයික යුෂ	පෙප්සීන්	ප්‍රොටියෝස පෙප්ටෝන
		ග්‍රහණිය	අග්න්‍යාසයික යුෂ	ට්‍රිප්සීන්	පොලිපෙප්ටයිඩ සරල පෙප්ටයිඩ
			අග්න්‍යාසයික යුෂ	කයිමොට්‍රිප්සීන් ට්‍රිප්සීන්	පොලිපෙප්ටයිඩ සරල පෙප්ටයිඩ
බත්	කාබෝහයිඩ්‍රේට්	මුඛය	බේටමය යුෂ	ටයලින්	ඩයිසැකරයිඩ
			අග්න්‍යාසයික යුෂ	ඇමයිලේස්	ඩයිසැකරයිඩ
				සුක්‍රේස්	ග්ලූකෝස් හා ෆෲක්ටෝස්
					ග්ලූකෝස් හා ග්ලූකෝස්
පොල් සම්බෝල	මේදය	ග්‍රහනිය			
			අග්න්‍යාසයික යුෂ	ලයිපේස්	මේද අම්ල හා ග්ලිසරෝල්

(ලකුණු 8)

iv. ඇමයිනෝ අම්ල ඇමයිනෝ කාණ්ඩය NH_2 අක්මාවේදී බිඳ හෙළීම.

09. i. 1. ස්ට්‍රෙප්ටොකොකස්ලැක්ටික් - කිරි මුදවීම.
කිරිවල අඩංගු ලැක්ටෝස් ලැක්ටික් අම්ලය බවට පත්වීම.
මේ නිසා කිරි ඇඹුල් වේ. ප්‍රෝටීන් කොටස කැටිගැසේ.
ලැක්ටොබැසිලස් බල්ගරිකස් - යෝගට් සෑදීම.
යෝගට්වල ආවේණික රසය ලබාගැනීම මෙය උදව් වේ.
යීස්ට් පාන් පිපීම.
සීනි ඊතයිල් මධ්‍යසාර සෑදේ.
CO_2 නිසා පිපීම සිදුවේ. (ලකුණු 6)

ii. තෛලෝදකරණය -
විශාල මේද ගෝලිකා කුඩා මේද ගෝලිකා බවට පත්වේ. මේ නිසා මේද ජීර්ණ එන්සයිමවලට ආහාර විශාල ප්‍රමාණයක් මත ක්‍රියාකාර ජීර්ණය පහසු කරයි. (ලකුණු 4)

iii . * දරුවාට ස්ථිර හෝ තාවකාලික ආබාධ තත්වයන් තිබේදැයි පරික්ෂා කර පිලියම් යෙදීම ප්‍රතිකර්ම ලබාදීම.
* කායික හෝ මානසික හේතු විමසා බලා කටයුතු කිරීම.
* සම වයස් දරුවන් සමඟ කථාබහට යොමු කිරීම.
* කතන්දර කවි ගීත ශබ්ද නගා කියවීම.
* නිවැරදි වචන උච්චාරණය කිරීම වැඩිහිටියන් සමඟ (ලකුණු 6)

iv . සංස්කෘතික, ආකල්ප, අගයන්, සාරධර්ම, සිරිත්විරිත් පිළිබඳ විමසීම කළ යුතුයි.
උදා : ඇඳුම් විලාසිතා, ගරු කළ යුත්තන්ට ගරු කිරීම, සිරිත් විරිත් ආරක්ෂා කිරීම, සදාචාරාත්මක ක්‍රියාවන් පිළිබඳ ආකල්ප, නව ප්‍රවණතා වලට දක්වන ප්‍රියභාවය. (ලකුණු 4)